# ජනාධිපති කාර්යාලය
# சனாதிபதி அலுவலகம்
# PRESIDENTIAL SECRETARIAT

මගේ අංකය : SP/PCMD/6/2015

2017 ජනවාරි මස 07 වන දින

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්
සියලුම පළාත් ප්‍රධාන ලේකම්වරුන්
සියලුම රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන්
සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්
සියලුම සංස්ථා හා ව්‍යාවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්

**<u>රාජ්‍ය ආයතන වල විදුලිබල පරිභෝජනය අවම කිරීම</u>**

බලශක්ති සංරක්ෂණය සහ කාර්යක්ෂම භාවිතය පිළිබඳ ජාතික වැඩසටහන යටතේ රාජ්‍ය ආයතන විසින් අනුගමනය කළ යුතු බලශක්ති සංරක්ෂණ ක්‍රමවේද සම්බන්ධයෙන් මා විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ අංක SP/PCMD/6/2015 හා 2015.10.06 දිනැති ලිපියෙහි උපදෙස් වලට වැඩිමනත් වශයෙනි.

විදුලිබල පරිභෝජනය අවම කිරීම තුලින් බලශක්ති කළමණාකරණයට සහය දීම මුළු මහත් ජනතාවගේම වගකීම මෙන්ම යුතුකමක් ද වේ. මේ දිනවල ශ්‍රී ලංකාවට බලපා ඇති වියළි කාලගුණ තත්ත්වය හේතුවෙන් විදුලිබල නිෂ්පාදනය සීමා කිරීමටද සිදුව තිබේ. තවද රාජ්‍ය ආයතන වල විදුලිබල පරිභෝජනයෙන් 60% - 70%ක ප්‍රමාණයක් වායු සමීකරණ සඳහා වැය වන බව වාර්තා වී ඇත. මෙම තත්ත්වය හේතුවෙන් බලශක්ති සංරක්ෂණ ක්‍රම උපරිම අයුරින් යොදා ගැනීම හරහා බලශක්තිය කාර්යක්ෂමව භාවිතා කිරීමට සහාය ලබාදීම කෙරෙහි ඔබගේ ප්‍රමුඛ අවධානය යොමු කරවමි.

ඒ අනුව ඔබ ආයතනය තුල වැය වන විදුලි ඒකක ප්‍රමාණය අඩුකිරීමට හැකි සෑම පියවරක්ම ගන්නා ලෙසත්, ඒ සඳහා මටද පිටපත් සහිතව සුදුසු පරිදි අභ්‍යන්තර චක්‍රලේඛ නිකුත් කිරීමට කටයුතු කරන ලෙසත්, අවශ්‍ය තොරතුරු, තාක්ෂණික උපදෙස් හා සහාය ශ්‍රී ලංකා සුනිත්‍යබල ශක්ති අධිකාරියෙන් ලබා ගන්නා ලෙසත් දන්වා සිටිමි.

එමෙන්ම රජයේ ආයතන වල විදුලිබල පරිභෝජනය පිළිබඳ විශ්ලේෂණාත්මක වාර්තා අතිගරු ජනාධිපතිතුමන් වෙත ඉදිරිපත් කිරීම සඳහා ඔබගේ ආයතනයේ මාසික විදුලි පරිභෝජනයෙහි ප්‍රගතිය සුනිත්‍ය බලශක්ති අධිකාරිය වෙත වාර්තා කළ යුතු බවද මෙයින් කාරුණිකව දන්වා සිටිමි.

පී.බී. අබේකෝන්
ජනාධිපති ලේකම්

පිටපත් :

1. ලේකම්
   විදුලි බල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය - සියළු කටයුතු සම්බන්ධීකරණය සඳහා
2. සභාපති
   ශ්‍රී ලංකා සුනිත්‍යබල ශක්ති අධිකාරිය - අවශ්‍ය තොරතුරු, තාක්ෂණික උපදෙස් ලබාදීම හා ඉහත පරිදි එවනු ලබන වාර්තා විශ්ලේෂණාත්මකව සාරාංශ ගත කර එවීම සඳහා

විමසීම් : ශ්‍රී ලංකා සුනිත්‍යබල ශක්ති අධිකාරියේ හර්ෂ වික්‍රමසිංහ මහතා, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
දු:අංක - 0112677445 / 0112911713 / 0712308307

ගාලු මුවදොර, කොළඹ 01 / காலி முகத்திடல், கொழும்பு 01 / Galle Face, Colombo 01.
දුරකථන / தொலைபேசி / Telephones: ++ 94 (0) 11 2354418, ++ 94 (0) 11 2473873
ෆැක්ස් / தொலைநகல் / Fax: ++ 94 11 2446657
ඊ-තැපෑල / மின்-அஞ்சல் / e-mail: prsec@presidentsoffice.lk